# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
(බාහිර) - 2008

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - **DMAT –E2015**

**අපරදිග නාට්‍ය හා රංග කලාව**

යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න එකක් (01) වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 12 යි　　　　කාලය : පැය 03 යි

---

## 1 කොටස

01. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය කෙරෙහි බලපෑ හේතු සාධක පිළිබඳ විමසීමක් කරන්න.

02. ඊඩිපස් චරිතයේ දුර්භාග්‍ය එම චරිතය සතු චරිත ලක්ෂණයන් හේතුකොටගෙන සිදුවන්නකි. පැහැදිලි කරන්න.

03. "ග්‍රීක නාට්‍යකරුවන් සිය කෘතීන් මගින් මවන ට්‍රැජඩි වීරයා බිහිවන්නේ ඕපපාතික බලවේගයක් හෝ කර්ම විපාකයකින් නොවේ." ට්‍රැජඩි නාට්‍ය කෘතීන් නිදසුන් ලෙස ගනිමින් පැහැදිලි කරන්න.

04. පහත සඳහන් මාතෘකා අතරින් 02 ක් පිළිබඳ විස්තර කරන්න.

    I. කතා වින්‍යාසය
    II. කොමඩි නාට්‍ය
    III. ග්‍රීක රඟමඩල
    IV. සටුර නාටක

## 11 කොටස

05. ප්ලෝටස් හා ටෙරන්ස් ගේ නාට්‍ය කෙරෙහි ග්‍රීක නාට්‍යකරුවන්ගේ ආභාසය කවරාකාරදැයි නිදසුන් සහිතව පහදන්න.

06. අනන්‍යතාවය හඳුනා ගැනීම පිළිබඳ ව්‍යාකූලත්වය අතිශය හාස්‍යාත්මක පරිසරයක් තුළ පිළිබිඹු කිරීම ප්ලෝටස්ගේ "කඹය" (RUDENS) නාට්‍යයේ දී සිදු වේ. පහදන්න.

07. මධ්‍යකාලීන ආගමික නාට්‍යයන් හි ප්‍රභවය හා විකාශය කෙරෙහි කවරාකාර හේතු සාධක බලපෑවේදැයි විග්‍රහ කරන්න.

08. ''සකලජන නාට්‍ය මධ්‍යකාලීන මිනිසාගේ පැවැත්ම පිළිබඳ අතිශය විවේචනාත්මක විග්‍රහයක් කරයි.'' විමසන්න.

## 111 කොටස

09. එලිසබතීන නාට්‍යයේ අන්තර්ගතය සහ ආකෘතිය සකස්වීම කෙරෙහි තත්කාලීන සමාජයේ බලපෑම කෙබඳුදැයි එම යුගයේ නාට්‍ය කෘතීන්වලින් නිදසුන් දක්වමින් පහදන්න.

10. හැම්ලට් කුමාරයා ''වීරයෙකු'' ලෙස සැලකිය හැක්කේ ඔහු අරගලයකට මුහුණ දී එහි අන්තය වශයෙන් මරණය ළඟා කරගත් බැවිනි. අදහස් දක්වන්න.

11. තාත්ත්විකත්වය හා උපහාසය ''බෙන් ජොන්සන්'' ගේ නාට්‍යයන්හි ප්‍රමුඛ ලක්ෂණ වේ. මෙහි සත්‍යතාවය විභාග කරන්න.

12. මෝලියර්ට සමාජයේ විවිධ චරිත පිළිබඳ ව තිබූ අවබෝධය සහ හාස්‍ය ගොඩනැඟීම සඳහා භාවිත කළ හාස්‍ය උපක්‍රම පිළිබඳ ඔහුගේ කෘතීන් ඇසුරින් විමසන්න.

**************************